# 8 ශ්‍රේණිය - විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන /වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.<br><br>1.2 මිශ්‍ර මත්කැටි ඇති තාලපද අධ්‍යයනය කරයි. | • බිලාවල් භූපාලි, කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත, සිරිසාර අති ශාන්ත/ ඇහැළ මහට/ සිරස නමමු<br><br>• ජප්තාලය සහ දීප්චන්දි යන හින්දුස්ථානී, තාලපද දෙතිතට අයත් දේශීය තාලපද<br>• හින්දුස්ථානී තාලයක කොටස් (මාත්‍රා විභාග, තාලස්ථාන, ආවර්ත) ($6_8$ Rhythm) | 1.බිලාවල්, භූපාලි, කාෆි, රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත ගායන හැකියා ප්‍රදර්ශනය කරයි.<br><br>2. නිර්දේශිත තාලපද අතින් නිරූපණය කර වෙන්කොට දක්වයි.<br><br>3. හින්දුස්ථානී තාලයක කොටස් හඳුනා ගනියි. | 20 |
| 2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | • ස්වර පුවරුව සඳහා කෝමල ග නි සහ ශුද්ධ ස්වර ඇතුළත් ගීත<br>• ස්වර පුවරුව මඟින් ළමා ගීත වාදනය<br>• ස්වරවාද්‍ය භාණ්ඩ සඳහා කෝමල ග නි සහ ශුද්ධ ස්වර ඇතුළත් ගීත<br>• හස්ත සාධන අභ්‍යාස<br>• සිතාර් එස්රාජ් භාණ්ඩවල ස්වභාවය, ස්වර පිහිටීම, සහ ඉතිහාසය | 1. ස්වර වාද්‍ය භාණ්ඩ මඟින් වාදන හුරුව ලබයි.<br><br>2. සිතාර් එස්රාජ් භාණ්ඩවල මූලික හුරුව ලබයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි. | 3.1 සරල ගීත රසාස්වාදනයේ යෙදෙයි.<br>3.2 භාරතීය ගීත ශෛලීන් රසාස්වාදනයට හුරු වෙයි.<br>3.3 කිතුනු බැති ගී රසාස්වාදනයේ යෙදෙයි.<br>3.4 වාර්ෂික විවිධ ප්‍රසංගය | • සරල ගීතයක කොටස්, බස සහ ආකෘතිය<br>• භජන්, රවීන්ද්‍ර ගී ගායනය<br>• භජන්, රවීන්ද්‍ර ගී ශෛලීන්හි විශේෂතා සහ<br>• කිතුනු බැති ගී ගායනය (දෙවන් පහන් මිණි නගා)<br>ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | 1. සරල ගීතයක කොටස්, බස සහ ආකෘතිය පැහැදිලි කරයි.<br>2. භජන්, රවීන්ද්‍ර ගී, කිතුනු බැති ගී ගායනයට පෙලඹෙයි.<br>3. මෙතෙක් උගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි. | 11 |
| 4.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 4.1 කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි. | • ගැමි ගීයේ විශේෂ ලක්ෂණ<br>• ගොයම් ගී, නෙළුම් ගී, කමත් ගී | 1. ගැමි ගී නිර්වචනය කරමින් ඒවා නිර්මාණ -යට බලපෑ හේතු සාධක විමසයි.<br>2. වී ගොවිතැන හා සම්බන්ධ ගැමි ගී ගායනය කරයි. | 06 |